(S)
00233

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

මුල් ළමාවිය සංවර්ධනය හා ප්‍රාථමික අධ්‍යාපන ඩිප්ලෝමා වැඩ සටහන -3 වන මට්ටම

අවසාන පරීක්ෂණය - 2019

**ESD1231/EPD3531-** විෂයමාලා අධ්‍යයනය සහ ප්‍රායෝගික

වැඩ -භාෂා අධ්‍යයනය (සිංහල/දෙමළ/ඉංග්‍රීසි)

කාලය - පැය තුනයි. (03)

---

දිනය - 2019.02.24 වේලාව - පෙ.ව.09.30 - ප.ව.12.30 දක්වා

---

1 වන කොටසේ සියළුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ තෝරා ගනු ලබන ඕනෑම ප්‍රශ්න තුනකට ද (03) පිළිතුරු සපයන්න.

## 1 වන කොටස

01. 1997 ප්‍රාථමික අධ්‍යාපන ප්‍රතිසංස්කරණ හඳුන්වාදීමට මුල්වූ කරුණු හතරක් (04) සඳහන් කරන්න.

02. "සන්නිවේදන නිපුණතා" පිළිබඳව කෙටියෙන් පැහැදිලි කරන්න.

03. භාෂාවක් ඉගෙනීමේ ඇති වැදගත්කම පිළිබඳව කරුණු හතරක් (04) ඉදිරිපත් කරන්න.

04. අතීතයේ ජීවත් වූ මිනිසා අදහස් හුවමාරු කර ගැනීමෙහි ලා යොදාගත් මාධ්‍යයන් හතරක් (04) ලියන්න.

05. ප්‍රාථමික පන්ති කාමරයක සිසුන් කණ්ඩායම් කිරීමේ ක්‍රම තුනක් (03) ලියන්න.

06. ගුරු උපකරණ යන්නෙන් අදහස් වන්නේ කුමක්දැයි උචිත උදාහරණයක් ඇසුරින් පැහැදිළි කරන්න.

07. ක්‍රියාකාරී පන්ති කාමරයක දැකිය හැකි ලක්ෂණ හතරක් (04) ලියන්න.

08. "අභිමත නිපුණතා" යන්නෙන් අදහස් වන්නේ කුමක් ද? උදාහරණ දෙමින් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 5 x 8 = 40)

## 2 වන කොටස

09. (i) භාෂාවකින් සිදුවන කාර්යයන් පහක් **(05)** විස්තර කරන්න. (ලකුණු 08)

(ii) ඉහත දැක්වූ කාර්යයන්ගෙන් දෙකක් **(02)** තෝරාගෙන ඒවා උදාහරණ දෙමින් විස්තර කරන්න. (ලකුණු 12)

10. (i) එඩ්ගා ඩේල් විසින් ඉදිරිපත් කරන ලද "අත්දැකීම් කේතුව" යන්නෙන් අදහස් වන්නේ කුමක්ද යන්න පැහැදිලි කරන්න. (ලකුණු 08)

(ii) ඉහත සඳහන් කළ අත්දැකීම් කේතුව ප්‍රාථමික ගුරුවරුන් සඳහා වැදගත් වන්නේ කෙසේද යන්න උදාහරණ දෙමින් පැහැදිලි කරන්න. (ලකුණු 12)

11. (i) අත්‍යාවශ්‍ය ඉගෙනුම් නිපුණතා යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද? උදාහරණ දෙමින් පැහැදිලි කරන්න. (ලකුණු 08)

(ii) ප්‍රාථමික පන්තිවල සිසුන්ගේ ප්‍රවීණතා මට්ටම සහතික කිරීම කළ යුතු වේ. මෙම ප්‍රවීණතා මට්ටමට ළඟා කිරීම සහතික කිරීමේ දී ප්‍රාථමික ගුරුවරුන්ගේ වගකීම් මොනවා ද? උදාහරණ දෙමින් පැහැදිලි කරන්න. (ලකුණු 12)

12. (i) ඔබ කැමති ප්‍රාථමික ශ්‍රේණියක් තෝරා ගෙන එම සිසුන්ගේ භාෂා හැකියා වර්ධනය කිරීමෙහි ලා ඇතුළත් ක්‍රියාකාරකම් සහ ගුරු උපකරණ සහිත පාඩම් සැලැස්මක් සකස් කරන්න. (ලකුණු 08)

(ii) ඔබ ඉහත සඳහන් කළ එක් ක්‍රියාකාරකමක් තෝරා ගන්න. එය සිසුන්ට ඉදිරිපත් කරන්නේ කෙසේ ද යන්න උදාහරණ දෙමින් පැහැදිලි කරන්න. (ලකුණු 12)

13. "ළමයකුගේ භාෂා හැකියා වර්ධනය සඳහා පරිසරය බෙහෙවින්ම වැදගත් වන සාධකයයි."

මෙම කියමන සමඟ ඔබ එකඟ වන්නේ ද? ඔබේ පිළිතුර උදාහරණ දෙමින් විස්තර කරන්න. (ලකුණු 20)

හිමිකම් ඇවිරිණි